# <u>හෝල් ඩි ගෝල් ශාලාව වෙන් කර ගැනීම.</u>

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල නිලධාරීන් සඳහා වන විවිධ රැස්වීම්,සම්මන්ත්‍රණ,පුහුණු වැඩමුළු,ප්‍රගති සමාලෝචන වැඩසටහන් හා රාජ්‍ය උත්සව පැවැත්වීම සඳහා මෙම ශාලාව යොදා ගැනේ.ඒවාට ගැටළුවක් නොවන පරිදි ඉඩ පහසුකම් පවතින අවස්ථාවල දී රජයේ ආයතන ප්‍රමුඛව වෙනත් ආයතන හා පාර්ශවයන් සඳහා ද ශාලා පහසුකම් ලබා දෙනු ඇත.

1. ශාලාව වෙන් කිරීමේ දී රාජ්‍ය ආයතන විසින් පවත්වනු ලබන වැඩසටහන් , සම්මන්ත්‍රණ සාකච්ඡා සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.
2. උත්සවය/වැඩසහන පැවැත්වීමට නියමිත දිනට දින 07 කට පෙර සම්පූර්ණ ගාස්තුව ගෙවිය යුතුය.
3. ප්‍රධාන ශාලාව පැය 24 ම වෙන් කර ගන්නා විට දින 2 ට වැඩි කාලයක් වැඩසටහන ක්‍රියාත්මක වන විට දිනකට පැය 8 කාල පරිච්ඡේද 2 ක් සඳහා රු.200000/= ක මුදලක් ගෙවිය යුතුයි.
4. වීඩියෝ ප්‍රාකාර, කලර් ලයිට් භාවිතා කරන්නේ නම් ප්‍රධාන ශාලාව සඳහා අමතර රු.10000/= ක ගාස්තුවක් ගෙවිය යුතු වේ.
5. ශාලාව වෙන් කර ගැනීමේ දී අයදුම්පත අනුමත කළ වහාම දිනකට රු.30,000/=ක ඇප මුදලක් තැන්පත් කල යුතුය. එක් දිනකට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ගන්නේ නම් දෙවන දින සිට එක් දිනකට රු.20,000/= වන පරිදි උපරිම රු.100000/= ක මුදලක් තැන්පත් කල යුතුය.
6. ශාලාව වෙන් කළ අයගේ පාලනයෙන් තොර අවස්ථාවක දී හැර මුදල් ගෙවා ශාලාව වෙන් කර ගත් පසු එය අවලංගු කර ගැනීම සඳහා කරන ඉල්ලීමක දී තැන්පත් මුදල ආපසු නොගෙවන අතර, එය රජයේ ආදායමට බැර කරනු ලැබේ. ශාලා ගාස්තු සම්පූර්ණයෙන් ගෙවා ඇති විට ගෙවීම් කර දින සිට දින 7 ට පසුව නැවත මුදල් ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම් පිළිබඳව සලකා බලනු නොලැබේ.
7. උත්සව,වැඩසටහන්,<u>සම්භාෂණ</u> සඳහා ශාලාව භාවිතා කිරීමේ දී ශාලාවට,උපකරණ හෝ දේපළ වලට හෝ රජයේ වෙනත් දේපළකට යම් අලාභ හානියක් වුවහොත් එය තැන්පත් මුදලෙන් අය කර ගනු ලැබේ. ඇප ඒ සඳහා ප්‍රමාණවත් නොවන්නේ නම්, හිඟ මුදල ශාලාව වෙන් කරගත් අය විසින් ගෙවිය යුතුය.
8. නාට්‍ය සංදර්ශන,විවිධ ප්‍රසංග,පෙර පාසල් උත්සව, <u>ප්‍රියසම්භාෂණ, සුහද හමු</u> සඳහා දින වෙන්කර ඇති අවස්ථාවක අත්‍යවශයෙන්ම සිදු කළ යුතු රාජ්‍ය උත්සවයක් යොදා ගැනීමට සිදු වුවහොත් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට සිදුවනු ඇත.
9. රාජ්‍ය විරෝධී වැඩසටහන්,සම්මන්ත්‍රණ,හෝ සභ්‍ය නොවන යැයි හැඟෙන කටයුතු සඳහා ශාලාව වෙන් කිරීම සිදු කරනු නොලැබේ.ශාලාව වෙන් කිරීමෙන් පසු එවැනි කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරනු ලැබුවහොත් වැඩසටහන අවලංගු කිරීමට කටයුතු කරනු ලබන අතර ශාලා ගාස්තු හෝ තැන්පතු මුදල නැවත ගෙවනු නොලැබේ.

10. ගාස්තු අය කිරීම.

   I. ගාස්තු අය කිරීම පහත පරිදි A හා B වශයෙන් ගාස්තු අවස්ථා දෙකක් යටතේ දක්වා ඇති අතර , ශාලාව වෙන් කල කාලයට අමතරව පෙර සූදානම් කටයුතු හා අතිරේක සෑම පැයකටම වායු සමන පහසුකම් සහිතව රු.<u>7,500/= ක්</u> ද වායු සමන පහසුකම් රහිතව රු.<u>5,000/=</u> ක් බැගින් ද අය කරනු ලැබේ.

   II. වායු සමන පහසුකම් සඳහා වැය වන විදුලි ගාස්තු,ජලය,සනීපාරක්ෂක පහසුකම්,ආරක්ෂක සේවා හා සේවක අතිකාල දීමනා පහත ගාස්තු තුල ඇතුලත්ව ඇත.

   III. ශාලාව වෙන් කිරීම සඳහා තැන්පත් කරන ලද තැන්පත් මුදල් මාස 3 ක් ඇතුලත ලබා ගත යුතු අතර එසේ ලබා නොගන්නා තැන්පතු මුදල් රාජ්‍ය අදායමට බැර කරනු ලැබේ.

   IV. ශාලාව වෙන් කිරීම සඳහා ගෙවනු ලබන තැන්පත් මුදල වැඩ සටහන පවත්වා මාස තුනක් ඇතුලත ලබා ගත යුතු අතර එසේ ලබා නොගන්නා තැන්පතු මුදල් රජයේ ආදායමට බැර කළ හැකිය.

V. යාබද ශාලාව පමණක් වෙන් කර ගන්නා අවස්තා වලදී විදුලිය ඇනහිටීමක් සිදුවුව හොත් විදුලිජනක යන්ත්‍රයෙන් විදුලිය සැපයීමට හැකියාවක් නොමැති අතර එසේ අවශ්‍ය වුවහොත් ඒ සඳහා පැයකට රුපියල් 20000/= ක අමතර ගාස්තුවක් ගෙවිය යුතු වේ.

VI. පහත ගාස්තු රජයේ වැඩ කරන දින සඳහා පමණක් වන අතර සති අන්ත හෝ රජයේ නිවාඩු දිනයක අදාළ වැඩසටහන පවත් වන්නේ නම් නියමිත ගාස්තුවට අමතරව රුපියල 5000/= ක අතිරේක ගාස්තුවක් ගෙවිය යුතුවේ.

VII. ශාලාවේ වැඩසටහන් පැවැත්වීමේදී පුටු ඉවත් කර හෝ සම්පූර්ණයෙන් වෙනස් කර ශාලා පහසුකම් ලබා ගන්නේ නම්, ශාලා ගාස්තුවලට අමතර අතිරේක රුපියල් 10000/= ක මුදලක් අය කරනු ලබයි.

VIII. විදුලි බලය තිබියදී වෙන්කර ගත් වැඩසටහන් සඳහා විදුලිය සැපයීම විදුලි ජනක යන්ත්‍ර භාවිතයෙන් කළයුතු නම් එම පහසුකම ලබාගැනීම සඳහා පැයකට රුපියල් 20000/= ක මුදලක් අයකරනු ලැබේ. එම මුදල වැඩසටහන පැවැත්වෙන දිට පෙර ගෙවා තිබිය යුතුය.

a. මෙම ගාස්තු සඳහා ආසන 600ක් පොල්තෙල් පහනක්, අඩි 3* 3 ප්‍රමාණයේ මේස 2 ක් නොමිලේ සපයනු ලැබේ.

b. වැඩසටහන් සංවිධායකයින් විසින් කසල ඉවත් කිරිම පිළිබඳව සහභාගිවන්නන් දැනුවත් කළ යුතු වන අතර ඉවතලන ආහාර/කඩදාසි/පොලිතින් වශයෙන් අපද්‍රව්‍ය නිසිපරිදි කසල බඳුන් තුලට වෙන් කර බැහැර කළ යුතුය. එසේ නොවන්නේනම් රුපියල් 5000/= ක දඩ මුදලක් අය කරනු ලැබේ.

c. වැඩසටහන් සංවිධායකයින් විසින් සියළුම වේදිකා සැරසිලි නිර්මාණ වලට අදාළ අපද්‍රව්‍ය සහ බැහැර කරන ලද අපද්‍රව්‍ය පරිශ්‍රයෙන් බැහැර කළයුතු අතර එසේ නොවන්නේනම් තැන්පත් මුදල් ආපසු නොගෙවනු ලැබේ.

A.සංස්ථා මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන, පෞද්ගලික ආයතන සහ වෙනත් පාර්ශවයන්

| වැඩසටහන | දිනකට (පෙ.ව.6.00 ප.ව.600) අතර පැය 8 ක කාලයක් පමණි) | • වරුවකට (පැය 4ක් පමණි) පෙරවරුව පමණක් හෝ පස්වරුව පමණක් විය යුතුය. |
|---|---|---|
| නාට්‍ය සංදර්ශන/සංගීත ප්‍රසංග/විවාහ උත්සව/ප්‍රියසම්භාෂණ/ප්‍රදර්ශන | 100000/= | • වරුවක් වෙන්කරනු නොලැබේ.<br>• ශාලාව දිනකට වෙන් කරවා ගත් ආයතනයකට හෝ පුද්ගලයෙකුට පෙර සූදානම් කටයුතු සඳහා පැය 4 ක කාල පරිච්චේදයක් රු.40000/= ට ලබා ගත හැක. |
| විවිධප්‍රසංග (පාසල්/පෙරපාසල්) සම්මාන ප්‍රධානෝත්සව | 100000/= | • පෙර සූදානම් හෝ අතිරේක පැය ලබා දීමෙන් තොරව පැය 4ක් සඳහා 50000.00 |
| පුහුණු හා වෙනත් | 100000/= | 50000.00 |

ඉහත වැඩසටහන් රාත්‍රී කාලයේ පවත්වන්නේ නම් (ප.ව. 6.00න් පසු රුපියල් 10000.00ක අමතර ගාස්තුවක් අයකරනු ලැබේ.

..ක් සඳහා ශාලාව වෙන් කිරීම පෙරවරුව හෝ පස්වරුව සඳහා පමණක් විය යුතු අතර (පෙ.ව.6.00 මධ්‍යාහ්න12.00) හෝ (ප.ව. 12.00-ප.ව.6.00) දෙකටම අයත් වන පරිදි ශාලාව වෙන් කරන්නේ නම් එක් දිනයක් සඳහා වෙන් කර ගත යුතුය.(උදා.පෙ.ව.9.00සිට ප.ව.2.00 දක්වා)

එක් වැඩසටහනක් සඳහා දින දෙකක් වෙන් කර ගත් විට වෙන්කරගත් කාලයෙන් පසුවද ශාලාව භාවිත කරන්නේ නම් එම අමතර කාලයටද පැයකට රුපියල් 5000.00 බැගින් අයකිරීමක් කරනු ලැබේ.

B. රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා විශේෂ ගාස්තු.

එම සහන ගාස්තු නියමිත ශාලා ගාස්තු සඳහා පමණක් වන අතර වෙනත් ගාස්තු හා අමතර පහසුකම් සඳහා අදාළ නොවේ. ප්‍රිය සම්භාෂණ සඳහා සහන ගාස්තු හිමි නොවේ.

වරුවකට - රු.30000.00 දිනකට - රු.60000.00

(රාජ්‍ය හා පෞද්ගලික සියළුම ආයතන හා පුද්ගලයින් සඳහා )

| අමතර සේවා | ගාස්තුව රු. |
|---|---|
| අමතර මේස 1ක් | 200.00 |
| විශේෂ අමුත්තන්ගේ පුටු 1ක් | 200.00 |
| ප්ලාස්ටික් පුටු 1 ක් | 50.00 |
| ශබ්දවිකාශන යන්ත්‍ර (පෝඩියම් එක සඳහා mic -1,top-02 ) | 8000.00 |
| පෝඩියම් mic -1, Fm mic 02,top-04,bin 02. | 20000.00 |

| අමතර සේවා | දිනකට රු. | වරුවකට රු. |
|---|---|---|
| යාබද ශාලාව | 30000.00(පැය 8ක් සඳහා) | 15000.00(පැය 4ක් සඳහා) |
| යාබද ශාලාව අතිරේක සෑම පැයකටම | 2000.00 | |
| යාබද ශාලාවේ රාත්‍රී කාලයේ පවත්වන වැඩ සටහන් සඳහා ඉහත මූලික ගාස්තුවට අමතරව | 5000.00 | |
| තැන්පතු මුදල්-යාබද ශාලාව /එළිමහන් අංගනය | පළමු දින 15000.00 වැඩිවන දිනකට 10000.00 | |
| බහුවිධ ප්‍රක්ෂේපණ යන්ත්‍රය අවශ්‍ය වේනම් පැයකට | 1000.00 | |
| එළිමහන් අංගනය- | 25000.00 | 15000/= |
| එළිමහන් අංගනය- ශබ්ද විකාශන කටයුතු සඳහා පමණක් විදුලි සැපයුම සහිතව | 25000.00 | 15000/= |
| එළිමහන් අංගනය-රාත්‍රී වෙන්කිරීම (ශබ්ද විකාශන කටයුතු සඳහා පමණක් විදුලි සැපයුම සහිතව | 30000.00 | |

සංගීත සංදර්ශන සඳහා එළිමහන් අංගනය භාවිතා කිරීමේදී අමතර රු.10000/= මුදලක් අය කරනු ලැබේ.

මෙම ගාස්තු 2024.06.01 දින සිට ක්‍රියාත්මක වේ.

ශාන්ත වීරසිංහ,
දිස්ත්‍රික් ලේකම් /දිසාපති
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය